# ST MARGARET'S
# පෞද්ගලික පාසල



***St Margaret's* පෞද්ගලික පාසල 1926 වසරේදී සිසුන් 18ක සංඛ්‍යාවකින් *Toorak Presbyterian* දේවස්ථානයේදී ආරම්භ විය. එය 1927 වසරේදී *Malvern* වෙත රැගෙන ගිය අතර 1929 වන විට වර්ථමාන පාසල් පරිශ්‍රය මිලදී ගෙන දුරස්ථ නේවාසික පාසලක් ලෙස පවත්වා ගෙන යෑමට අවශ්‍ය පරිදී ගොඩනැගිලි ඉදිකිරීම ආරම්භ විය.**

**1930 වසර වන විට පාසලේ සිසුන් පිරිස 300 ක් දක්වා වර්ධනය වී තිබූ අතර 1941දී පාසල සම්පූර්ණයෙන්ම *Berwick* වෙත රැගෙන විත් ස්ථාපිත කරන ලදී. *Berwick Grammar School* 2009 වසරේදී *Officer* වෙත රැගෙන යන ලදී. මෙම පාසල් ද්විත්වය *VCE* විභාගය සඳහා විශිෂ්ඨ ප්‍රතිඵල හිමි කරගන්නා අධ්‍යාපන මට්ටම ඉතාම ඉහළ තත්ත්වයක පවතින පාසල් දෙපළකි. දරුවන්ගේ අතිරේක දක්ෂතා ඔප් නංවන වැඩසටහන් රැසක් ක්‍රියාත්මක වන සහ සෑම අතින්ම දරුවන්ගේ ඉදිරි අනාගතය දීප්තිමත් කිරීමට වෙර දරන විෂයය නිර්දේශයක් සහිත මෙම පාසල් යුගල මේවන විට දෙමව්පියන් අතර වඩාත් ප්‍රචලිත පාසල් පද්ධතියකි.**

**ශ්‍රී ලාංකික දෙමව්පියන් වන අප සැමවිටම පාහේ අපේ දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව තීරණ ගැනීමේදී සැලකිල් ලෙන් කටයුතු කරන ප්‍රජාවක් ලෙස ප්‍රකටය. දරුවන් වෙනුවෙන් වඩා යහපත් පාසලක් තෝරා ගැනීමට අප ආරම්භයේ පටන් උනන්දුවන්නේ සියළුම පසුබිම් සාධකද සලකා බලමිනි. මෑත ඉතිහාසය දෙස බැලූ විට Berwick නගරය අවට ඇති Clyde, Officer සහ Cranbourne යන ප්‍රදේශ වලට සංක්‍රමණය වන ශ්‍රී ලාංකිකයන්ගේ සංඛ්‍යාත්මක වර්ධනයක් අපට පැහැදිලිව දක්නට ලැබුණි. එසේ මෑතකදී පැමිණි ශ්‍රී ලාංකිකයින්ට ප්‍රදේශයේ ඇති ප්‍රචලිත පාසල් පිළිබඳව යම් අදහසක් ලබා දීමේ අරමුණෙන් St Margaret's School සහ Berwick Grammar School යන පාසල් ද්විත්වය පිළිබඳව එහි විදුහල්පතිනිය වන Annette Rome සමඟ කළ විවෘත කථා බහක් පහතින් දක්වා තිබේ.**



### *ඔබ St Margaret's School iy Berwick Grammar School යන පාසල් ද්විත්වයේ විදුහල්පතිනිය වශයෙන් පත්වීම පිළිබඳව ඔබට පුද්ගලිකව දැනෙන්නේ කෙසේද?

මා මීට පෙර පාසල් කිහිපයක නියෝජ්‍ය විදුහල්පතිනිය වශයෙන් සේවය කොට තිබුණත් විදුහල්පති තනතුරකට පත් වූ ප්‍රථම අවස්ථාව මෙයයි.

St. Margaret's සහ Berwick Grammar යන පාසල් ද්විත්වයේ විදුහල්පති තනතුරට පත්වීමට පෙරාතුව MLC(Methodist





Ladies' College),Lauriston Girls' School සහ Wesley College වැනි පාසල් කිහිපයකම නියොජ්‍ය විදුහල්පතිනිය ලෙස මා කලක් සේවය කොට අත්දැකීම් ලබාගෙන තිබෙනවා.

St.Margaret's සහ Berwick Grammar යන පාසල ද්විත්වය පිළිබඳව මා පුද්ගලිකව දැන සිට පරිදි, ඒ පාසල් ද්විත්වය ඔස්ට්‍රේලියාවේ තිබෙන මැනවින් ස්ථාපිත වූත් ඉහළ කීර්තියක් අත්පත් කරගත්තා වූත් ප්‍රබල පාසල් පද්ධතියක්. වසර සියයකට ආසන්න අතීතයක් හිමි St. Margaret's පාසල සිය අතීත කීර්තිනාමය අඛණ්ඩව පවත්වා ගෙන ආ පාසලක්. එනිසා මෙම පාසලේ විදුහල්පතිතනතුරට මා තෝරාපත් කරගත් විට මා ඉතාම කැමැත්තෙන් සහ උද්යෝගයෙන් එම තනතුර බාරගත්තා. St.Margaret's කණිෂ්ඨ පාසල, ද්විතීයික බාලිකා පාසල සහ Berwick Grammar ද්විතියික බාලක පාසල යන සමස්ථ පාසල් පද්ධතියේම විදුහල්පතිනිය ලෙස මා මගේ උපරිම කැපවීමෙන් සහ බලවත් සතුටින් රාජකාරී කටයුතු කරමින් සිටිනවා.

### *මෙම පාසල් පද්ධතිය තුල ඔබ පුද්ගලිකව දකින සුවශේෂතා මොනවාද?

මෙම පාසල තුල දරුවෙක් වෙනුවෙන් උපරිම අවස්ථාවන් ප්‍රමාණයක් අන්තර්ගත කරන ලද විශිෂ්ඨ අධ්‍යයන විෂයය මාලාවක් ක්‍රියාත්මක වන බව අවශ්‍යයෙන්ම සඳහන් කළ යුතු කාරණයක්. එය මා දකින ප්‍රධාන සුවිශේෂි කාරණයක්.

එකී විෂයය මාලාව තුල විශේෂිත වූත් ව්‍යති රේකීවූත් වැඩසටහන් කිහිපයක්ම ක්‍රියාත්මක වෙනවා යැයි කීම නිවැරදියි. ඉන් පළමු වැන්න ලෙස STEM (Science, Technology, Engineering and Mathematics) වැඩස ටහන හඳුන්වා දිය හැකියි. විශේෂයෙන්ම අපේ බාලිකා පාසලේ සිසුවියන් අතරින් බහුතරයක් ඉහත මා විසින් සඳහන් කරන ලද විෂයයන් වෙනුවෙන් ඉහළ සහභාගීත් වයක් සහ සමර්ථභාවයක් දක්වමින් ඉදිරියෙ න් සිටීම විද්‍යාඥවරියක ලෙස මගේ සතුටට කාරණයක්. මන්දයත් මා රසායන විද්‍යාව සහ ජෛව විද්‍යාව යන විෂයයන් ප්‍රගුණ කළ අයෙකු ලෙස මෙම ප්‍රතිඵල වල වටිනා කම මට ඉතාම පැහැදිලිව දැනෙන නිසා.

මීට සමගාමීව මෙම පාසල තුල දරුවෙකුගේ සංගීත නිපුණතාවය ප්‍රවර්ධනය කරගැනීමට ඇති ඉඩකඩ සාධනීය මට්ටමක තිබෙන බව මා කිවයුතුයි. Victorian School of Performing Arts –VSPA විසින් ක්‍රියාත්මක කරන අංගසම්පූර්ණ පංතිකාමර වලින් සහ වාද්‍යභාණ්ඩ වලින් සමන්විත මෙම වැඩස ටහනේ මුඛ්‍ය අරමුණ "අපූර්වත්වය පිළිබඳව යහපත් හැඟීම් පුබුදු කිරීම" යන්නයි. පුද්ගලිකවත් මා සංගීතයට ලැදි කාන්තාවක් නිසා මෙම පාසල තෝරා ගැනීමේදී ඉහත කාරණාවත් මා සැලකිල්ලට ගත්තා.

මා මෙල්බර්න් විශ්ව විද්‍යාලයේ විද්‍යාර්තීන් සමඟ ඉතාම සමීපව කටයුතු කරනවා. අප පාසල තුල ක්‍රියාත්මක වන ඇතැම් වැඩස ටහන් ව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට මෙල්බර් න් විශ්ව විද්‍යාලයේ ආචාර්ය ඉකෙබාල් හසීම් සම්පත් දායකයකු ලෙස සම්බන්ධ වීම ඇත්තටම විශාල උද්යෝගයක්. අනෙත් සුවිශේෂ කාරණය ලෙස මා දකින්නේ අප පාසලේ ගුරුවරුන්ගේ අධ්‍යයනයන් කෙරෙහි පාසල් බලධාරීන් දක්වන විශේෂ උනන්දුවයි. මන්දයත් දරුවන්ගේ අධ්‍යාපන මම්ටම නගාසිටුවීමේ කාර්යයයේදී ගුරුවරුන්ගේ අඛන්ඩ අධ්‍යයනයන් සහ යාවත්කාලීන වීම් ඉතාම වැදගත් කාරණයක් ලෙස අප විසින් සැලකීම. ගුරුවරුන්ගේ විෂයය දැනීම කෙතරම් ගැඹුරුද ඔවුන් තමන්ගේ විෂයය කෙරෙහි දක්වන ප්‍රතිභාව කෙතරම් සුවිශේෂිද යන කරුණු අප විසින් නිතරම ඇගයීම් වලට ලක්කරනු ලබන දෙයක්.එය සමස්ථ පාසල් පද්ධතිය තුලම දිවයන සංකල්පයක් සහ හරයක්.

මේ හැරුණු කොට පාසල තුල පවතින රමණීය බහුසංස්කෘතික පරිසරය මා තුල ඇති කළ විශ්මය මේ පාසල වෙත මා බැඳ තැබීමට සමත් වුණා.මැලේසියාව, බෝර්නි යෝ සහ එංගලන්තයේ අතරින් පතර ගෙ වුණු මගේ ළමා විය නිසා විවිධ සංසකෘතින් පිළිබඳව මා තුල පවතින අනවරථ ගරුත්වය හේතුවෙන් බහුසංස්කෘතික පරිසරය තුල කටයුතු කිරීම මා ප්‍රබෝධයට පත් කරන සුවිශේෂි කාරණයක්. ගෝලීය පුරවැසියකු බිහිකිරීමේ සාඩම්බර කාර්යයක නිරත වී සිටින අපේ පාසල් පද්ධතියේ අවසාන ඉලක්කය ගෝලීය පෞරුෂයක් සහ ස්වීයත්වයක් සහිත අනාගත දරුවකු සාර්ථක ලෙස සමාජයට මුදා හැරීමයි. VCE විභාගයට සමගාමීව ගෝලීය පුරවැසිභාවය (Global Citizenship) යන තත්ත්වය හිමිකරගත් දරුවකු පාසලෙන් පිටව යෑම නොවැරදීම අපට ආඩම්බරයක්. ගෝලීය පුරවැසිභා වය යන අදහස ගොඩනැගෙන්නේ භාෂා ඥානය, අන්තර් සංස්කෘතික ශක්‍යතාවය වැනි මූලිකාංගත් PISA (Programme for International Student Assessment) ඇගයීමත් යන කරුණු සියල්ලේ සංකලනයෙන්.

අප පාසලෙන් සමත් වී යන දරුවන්ගෙන් 80% ක ප්‍රතිශතයක් වෙනත් රටවල් වල වෘත්තිකයන් ලෙස සාර්ථකව ගොඩනැගී තිබීම ඉහත කී කාරණා වල ප්‍රතිඵලයක්. මගේ ආචාර්යය උපාධිය වෙනුවෙන් මා කරන අධ්‍යයනයන් බොහොමයක් මෙම වටපිටාව තුල ගොඩනැගෙන කාරණා බැවින් අව්‍යාජ අන්තර්ජාතික නිපුණත්වයක් සහිත දරුවන් පාසලක් තුලින් බිහිකිරීමේ වැදගත්කම පිළිබඳව මනා අවබෝධයක් මා තුල තිබෙන බැව් කිව යුතුයි.

තම මව් භාෂාව පිළිබඳව දරුවකු තුල තිබෙන අවබෝධය සහ විවිධ සංස්කෘතීක හරපද්ධතීන් සහ විවිධ භාෂාවන් පිළිබඳව තිබෙන උනන්දුව දරුවකුගේ අනාගතය කෙරෙහි වැදගත්වන්නේ කෙසේද යන කාරණය පිළිබඳව අප පාසල විශේෂ උනන්දුවක් දක්වන බව කිව යුතුයි. මෙම පාසලේ සුවිශේෂත්වයත් එයයි.

### *St.Margarets' iy Berwick Grammar පාසල් පද්ධතිය තුල ක්‍රියාත්මක වන එහි නියමුවා වන ඔබ විසින් පුද්ගලිකව භාවිතාවෙ යොදන ඔබට අනන්‍ය වූ සංකල්ප පිළිබඳව ඔබේ අවංක මතය කවරක්ද?

ඇත්තවශයෙන්ම මා මීට ප්‍රථමයෙන් සඳහන් කළ පරිදි ගෝලීය පුරවැසියකු බිහිකිරීමේ කාර්යයයේදී අප විසින් අනුගමනය කරන ක්‍රමවේදයන් සහ සංකල්ප ඇතැම් විට සමස්ථ ඔස්ට්‍රේලියාවටත් ඉන් නොනැවතී ඔස්ට්‍රලේශියාවටත්(Tslkshd කලාපය හෙවත් ඔස්ට්‍රේලියාව, නවසීලන්තය සහ ඒ ආශ්‍රිත අසල්වැසි පැසිෆික් සාගරික දිවයින් ඇතුළු කලාපය මේ නමින් හැඳින්වේ) නවමු අත්දැකීම් විය හැකියි.

අප පාසලේ බොහොමයක් සිසුන් ප්‍රජා සේවාවන් වල නිරත වන අතර ඒ තුලින් ඔවුන් තම ජීවිතයට එකතු කරගන්නා වටිනාකම් පිළිබඳව තක්සේරුව අප්‍රමාණයි. ප්‍රධාන කොටම අයර්ලන්ත , ස්කොට්ල න්ත, ඉන්දීය සහ ශ්‍රී ලාංකික සංස්කෘතික පද්ධතීන්ට අයත් වන සිසුන් ගෙන් සමන්විත බහුසංස්කෘතික වටපිටාවක් තුල සිසුන් අන්‍යෝන්‍ය සංස්කෘතීන් පිළිබඳව මනා වැටහීමක් ඇතිව අනාගත ඉලක්ක සඳහා තම ඉගෙනුම් කාර්යයන් තුල නිරත වන බව